130

Class No. 658.31422 K57

# විවෘත විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන අධ්‍යයන අංශයේ අධ්‍යාපනපති උපාධිය

## සඳහා ඉදිරිපත් කෙරෙන

## පර්යේෂණාත්මක අධ්‍යයනය

මාතෘකාව:- උපාධිධාරී ගුරුවරුන් සිය සේවාව තුලින් ලබන තෘප්තියේ ස්වභාවය

පිළිබඳව කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්

උපදෙස් හා මග පෙන්වීම: -

අධ්‍යාපන තාක්ෂණ අංශයේ ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය

ආචාර්ය රූපා විජේරත්න මහත්මිය

ශිෂ්‍යාව: - ජයන්ති ඉන්ද්‍රානි කොතලාවල

REFERENCE ONLY

පරීක්ෂණය: - අධ්‍යාපනපති උපාධිය – 1995

ලියාපදිංචි අංකය: - 67596110

64684

## පර්යේෂණ සාරාංශය


ගුරුවරුන්ගේ සේවා තෘප්තියේ ස්වභාවය අධ්‍යයනය කරමින් උපාධිධාරී ගුරුවරුන් සිය සේවාවේන් ලබන තෘප්තියේ ස්වාභාවය සෙවීම හා සේවාව තුලින් තෘප්තියක් ලබන්නේදැයි සෙවීම මේ පර්යේෂණයේ අරමුණ වේ.

සේවා තෘප්තිය සෙවීම සඳහා විවිධ වෘත්තීන් ඇසුරින් සේවා තෘප්තියේ ස්වභාවය හඳුනා ගැනීමට කරන ලද පර්යේෂණ විමර්ශනයට ලක්කරමින් ඒ අනුසාරයෙන් ගුරුවරුන්ගේ සේවා තෘප්තිය හඳුනා ගැනීමට උත්සාහ කලෙමි.

උපාධිධාරී ගුරුවරු වැනි විශාල ලෙස පැතිරුණු ජනගහනයක් පුරාම සාමාන්‍යකරණය කලහැකි නිගමන යෝජනා ඉදිරිපත් කිරීමේ අවස්ථා පහසුකරණ සමීක්ෂණ පර්යේෂණ ක්‍රමය යොදා ගතිමි.

මුළු දිවයිනේ උපාධිධාරී ජනගහනය නියෝජනය වන පරිදි උපාධිධාරී ගුරුවරු විශාල පිරිසක් සේවය කරන මාතර දිස්ත්‍රික්කයේ උපාධිධාරීන් ඉලක්ක ජනගහනය ලෙස තෝරා ගතිමි. මාතර අධ්‍යාපන කලාපයේ පාසල් නාමාවලියෙන් ගුරුවරු 80ක් අහඹු ලෙස තෝරාගෙන නියැදිය සකස් කලෙමි.

දත්ත විශ්ලේෂණයේදී ගුරුවරුන්ගේ සේවා තෘප්තියට හේතු වූ ප්‍රධාන කරුණු මෙසේ ගොනු කල හැකි විය.

* සාර්ථක පන්ති කළමනාකරණය
* අපක්ෂපාතිත්වයෙන් යුතු මනා පරිපාලනය
* සේවාවේ ඇගයීම් හා උපස්තම්භන
* සිසුන් ප්‍රජාව තමා පිලගෙන විශ්වාසය තැබීම
* කුසලතා හා වෘත්තිමය කුසලතා වර්ධනයට ලැබෙන සහය
* තම පෞද්ගලික ජීවිතයට ඉන් ලැබෙන සහය

තෘප්තිය හීන කරන සාධකද මෙසේ ගොනු කළ හැකිය.

* පක්ෂපාතී පරිපාලනය හා දේශපාලන බලපෑම්
* නිසි ඇගයීමක් නැති බව හා වෘත්තීය කුසලතා වලට ඇති බාධා
* පහසුකම් අඩු දුෂ්කර ප්‍රදේශ වල සේවාව
* මාරුවීම් උසස්වීම් ඇගයීම් දේශපාලන බලපෑම් මත සිදුවීම
* විවිධ අවස්ථා උපයෝගී කරගෙන ගුරු වෘත්තිය හෑල්ලුවට ලක්කිරීම

ඉහත දැක්වෙන කරුණු විමසා බැලීමෙන් පසු පහත දැක්වෙන නිගමනයන්ට එළඹුනෙමි.

* ගුරුවරුන්ගේ සේවා තෘප්තිය පුද්ගලබඳව ඔවුන් රාජකාරිය කෙරේ දක්වන ආකල්ප හා ඔවුන්ගේ අපේක්ෂණ මත රඳා පවතී.
* සේවා තෘප්තිය පාසල් පන්ති කළමනාකරණය හා විදුහල්පති ප්‍රමුඛ පරිපාලනයේ සහයෝගය හා සබඳතා මත තීරණය වේ.
* සේවාවෙන් තෘප්තිමත් වූවෝ සාර්ථක සේවාවක නිරත වෙමින් රාජකාරිය පිළිබඳ ධන ආකල්ප දරත්.

පහත කියවෙන කරුණු යෝජනා ලෙස ඉදිරිපත් කරමි.

* ගුරුවරුන්ගේ සේවා තෘප්තිය ඇති කිරීමට ඔවුන් සේවයට බඳවා ගැනීම උසස් කිරීම මාරු කිරීම ඇගයීම සාධාරණ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති මත සිදුකිරීම
* පාසල් පන්ති කළමනාකරණයට ගුරුවරයාට පූර්ණ නිදහස තිබිය යුතු අතර අපක්ෂපාති පරිපාලනයට ලක්වීම
* ගුරුවරයාගේ වෘත්තීය කුසලතා වර්ධනයට අවශ්‍යතා අනුව ඉඩ ප්‍රස්ථාව ලැබීම
* ගුරුවරයා මුහුණ දෙන ගැටළු විසඳීමට ගුරු උපදේශන සේවයක් ඇරඹීම
* ගුරුවරයා ශිෂ්‍යයා හා අධ්‍යාපනය සැලසුම් කරන්නන් අතර මනා අවබෝධයක් තිබීම අවශ්‍යය.
* ගුරු භූමිකාව සතු කාර්යභාරය පිළිබඳව සමාජය දැනට වඩා දැනුවත් කිරීම